# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,934 — 1970 නොවැම්බර් 27 වැනි සිකුරාදා — 1970.11.27**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් සංඛ්‍යාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 891 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 892 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 893 |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 896 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... | 897 |
| මිළ පාලන දැන්වීම් ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 905 |
| ''සුරාබද්ධ ආඥාපනත'' පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 383**

අංකය : ඩීජී. 41/ආර්සීසී (II).

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීමක්

පහත නම් සඳහන් නිලධාරියා 1969 මැයි 18 වැනි දින සිට ලංකා යුද්ධ හමුදා යුද්ධායුධ බලකායේ අණදෙන නිලධාරි වශයෙන් :—

ලුතිනන් කර්නල් ගාමිණී රිචඩ් සි ජයසිංහ, ලයුයුබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් 9 දින,
කොළඹ දීය.

11-856

**1970 අංක 384**

අංකය : ඩීඑච්/වීඑෆ්/22/ඒ.

### යුද්ධ හමුදාව—ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්විතීයනය කිරීමක්, උසස් කිරීමක් සහ පත් කිරීමක්

(අ) ද්විතීයනය කිරීම

යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවේ පහත නම සඳහන් නිලධාරියාව 1970 නොවැම්බර් මස 14 වැනි දින සිට එක් වර්ෂයක කාලපරිච්ඡේදයකට නිත්‍ය බලසේනාවේ සේවය සඳහා ද්විතීයනය කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ප්‍රසාදය පළකොට ඇත :—

ලුතිනන්. අනුරුද්ධ වන්සදර රත්වත්තෙ, ලං.සි.රෙ.

(ආ) උසස් කිරීම

1970 නොවැම්බර් මස 14 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කර්නල් වශයෙන් :—

ලුතිනන්. අනුරුද්ධ වන්සදර රත්වත්තෙ, ලං.සි.රෙ.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ**

1970 ජූනි 2 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ඇ) පත් කිරීම

1970 නොවැම්බර් මස 14 වැනි දින සිට යුද්ධ හමුදා මූලස්ථානයේ ආරක්ෂක සම්බන්ධතා නිලධාරි වශයෙන් තාවකාලික ලුතිනන්-කර්නල් අනුරුද්ධ චන්සදර රත්වත්තෙ, ලං.සි.රෙ. පත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 23 දින,
කොළඹ දීය.

11-1198

---

**1970 අංක 385**

අංකය : සීජී. 252/ආර්ජීසීවී/2.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

**උසස් කිරීම්**

1970 ජූනි මස 1 දින සිට ප්ලයිට් ලෙප්ටිනන්ට්වරුන් වශයෙන්—
ප්ලයිං ඔපිසර් ඩග්ලස් හෙන්රි අබේසේකර—(01127)—

කාර්මික/සංඥ ප්ලයිං ඔපිසර් විමලසිරි ධර්මසේන විජේනායක—(01128)—උපකරණ.

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් 14 දින,
කොළඹ දීය.

11-855

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 386**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත:—

ඒ. 32/69.

ගාල්ල දිස්ත්‍රික්කයේ දිසාපති, ලංකා පරිපාලන සේවයේ වී. සී. බී. උනන්තැන්න මහතා, සවකීය රාජකාරිවලට අමතරව එම දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය සුළු කර්මාන්ත අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒබී. 104/70.

නියෝජ්‍ය භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ සී. බී. පට්ටිආරච්චි මහතා, සිය රාජකාරිවලට අමතරව, 1970 නොවැම්බර් මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තෙක්, භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බැලීමට.

ඒ. 87/70.

ලංකා පරිපාලන සේවයේ එල්. එන්. ද එල්. බණ්ඩාරනායක මහතා 1970 ඔක්තෝබර් මස 12 වැනි දින සිට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ, අතිරේක ස්ථිර ලේකම් තනතුරක වැඩ බැලීමට.

ඒ. 32/69.

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ආර්. ඩී. නිලවීර මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ආර්. ඩී. නිලවීර මහතා සවකීය රාජකාරිවලට අතිරේකව, 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මොණරාගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ආර්. ඩී. නිලවීර මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්නයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඒ. 34/68.

ලංකා පරිපාලන සේවයේ පී. බී. වන්නිනායක මහතා 1970 අගෝස්තු මස 28 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන, එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක සහකාර ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 34/68.

ලංකා පරිපාලන සේවයේ, ඩී. එම්. ආරියරත්න මහතා 1970 අගෝස්තු මස 28 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 116/67.

ආගමන හා විගමන සහකාර පාලක, ලංකා පරිපාලන සේවයේ කේ. විසුවලිංගම් මහතා 1970 අගෝස්තු මස 26 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සිය රාජකාරිවලට අමතරව, ඉන්දියානු මූලෝත්පත්තියක් ඇති පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ සහකාර කොමසාරිස්වරයෙකු ලෙස බැලීමට.

ඒ. 7/70.

වවුනියාව පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත, ලංකා පරිපාලන සේවයේ එන්. ඩී. ජයවීර මහතා සවකීය රාජකාරිවලට අමතරව 1970 අගෝස්තු මස 21 දින සිට 1970 අගෝස්තු මස 31 දින දක්වා මන්නාරම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 5/70.

ලංකා පරිපාලන සේවයේ, එච්. එච්. එම්. ටී. ජී. විජේරත්න මහතා 1970 අගෝස්තු මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒඒ. 72/70.

සී. රාජගෝපාල් මහතා 1970 අගෝස්තු මස 17 වැනි දින සිට දුම්රිය දෙපාර්තමේන්තුවේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරී (කාර්මික) ලෙස.

ඒ. 5/70.

ලංකා පරිපාලන සේවයේ, එන්. සමරසුන්දර මහතා 1970 අගෝස්තු මස 15 දින සිට නැවත නියමයක් කරනතුරු කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 1/67.

ලංකා පරිපාලන සේවයේ, ජී. පී. ඉලංගසිංහ මහතා 1970 අගෝස්තු මස 11 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, අතිරේක නිරවුල් කිරීමේ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 116/67.

ආගමන හා විගමන සහකාර පාලක, ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ටී. ප්‍රනාන්දු මහතා 1970 අගෝස්තු මස 10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සවකීය රාජකාරිවලට අමතරව, ඉන්දියානු මූලෝත්පත්තියක් ඇති පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ සහකාර කොමසාරිස්වරයෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 1/67.

ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. ඩී. අයිලප්පෙරුම මහතා 1970 අගෝස්තු මස 3 වැනි දින සිට, ප්‍රවාහන අමාත්‍යාංශයේ සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 1/67.

ලංකා පරිපාලන සේවයේ, ඊ. අයි. ද සිල්වා මහතා 1970 අගෝස්තු මස 1 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, ආනයන හා අපනයන නියෝජ්‍ය පාලක තනතුරෙහි වැඩ බැලීමට,

ඒ. 59/70.

ලංකා පරිපාලන සේවයේ, අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු මහතා, 1970 ජූලි මස 14 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු ධීවර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයන් වැඩ බැලීමට.

ඒ. 1/67.

ලංකා පරිපාලන සේවයේ, පී. තිරුනාවකරසු මහතා 1970 ජූලි මස 12 වැනි දින සිට නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

මාතර පාලන දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත ලංකා පරිපාලන සේවයේ පී. දේවේන්ද්‍ර මහතා 1970 ජූලි මස 6 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, සවකීය රාජකාරිවලට අමතරව, මාතර පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය සුළු කර්මාන්ත අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සහකාර ආහාර පාලක, ලංකා පරිපාලන සේවයේ පී. එම්. ජී. සෙනෙවිරත්න මහතා 1970 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, සවකීය රාජකාරිවලට අමතරව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මෝටර් රථ ප්‍රවාහන සහකාර කොමසාරිස්වරයෙකු ලෙස වැඩ බැලීමට.

ඒ. 1/67.

ගාල්ලේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත වී. සී. බී. උනන්තැන්න මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී, ගාල්ලේ වැඩ බලන අතිරේක ආණ්ඩුවේ ඒජන්ත, ලංකා පරිපාලන සේවයේ ජී. පී. ඇස්. යූ. ද සිල්වා මහතා, සිය රාජකාරිවලට අමතරව 1970 ජූනි මස 29 වැනි දින සිට ගාල්ල දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඒ. 45/70.

ලංකා පරිපාලන සේවයේ ඩී. එෆ්. බාලචන්ද්‍ර මහතා, 1970 ජූනි මස 24 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ලං. ප. සේ. IV වැනි පන්තිය) තනතුරක වැඩ බැලීමට.

ඒ. 45/70.

ලංකා පරිපාලන සේවයේ, ඩී. ජී. පී. සෙනෙවිරත්න මහතා, 1970 ජූනි මස 21 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 45/70.

ලංකා පරිපාලන සේවයේ කේ. ඒ. පෙරේරා මහතා, 1970 ජූනි මස 21 වැනි දින සිට, නැවත නියමයක් කරනතුරු, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ලං. ප. සේ. IV වැනි පන්තිය) තනතුරක වැඩ බැලීමට.

එස්. පී. නානායක්කාර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැපැල් පෙට්ටිය අංක 500, කොළඹ 1,
1970 නොවැම්බර් මස 20 දින දීය.

11-1056

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 387**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත :—

අංකය : ජේඒ. 11/48.

ඩී. කෘ. එම්. සිරිමාන මහතා ඔහුගේ වෙනත් රජකාරිවලට අතිරේක වශයෙන් 1970 සැප්තැම්බර් මස 30 දින සිට කොළඹ දි. උ. අංක 70358/එම්, 69350/එම්, 71497/එම් සහ බී/42 දරණ නඩු අවසානකර තීන්දු දීම පිණිස කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 11/48.

ඩී. විමලරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 නොවැම්බර් මස 25 වැනි දින සිට කොළඹ දි. උ. අංක 1988/ඉසෙඩ්එල් දරණ නඩුව ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 18/48.

ඩී. ඊ. ධම්සේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 නොවැම්බර් මස 26 දින සිට ගාල්ල දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 6909, ඩී. 3326, එල්. 7631, එල්. 7656, එල්. 7417, පී. 4786, එම්. 3522 දරණ නඩුවල තීන්දුව දීම පිණිස ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 33/48.

ජේ. ජී. එල්. සවාරිස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 දෙසැම්බර් මස 18 වැනි දින සිට කෑගල්ල දි. උ. අංක 13784 දරණ බෙදුම් නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 47/48.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 නොවැම්බර් මස 4 වැනි දින සිට පානදුර දි. උ. අංක 11649, 11552, 11664, 6916, 11659, 11694, 11246, 11268 සහ 11771 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දු දීම පිණිස පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 12/48.

ඊ. එෆ්. ද සිල්වා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1970 නොවැම්බර් මස 11 දින සිට කොළඹ ම. උ. අංක 26667/ඒ, 12887, 20903/ඒ, 29946/ඒ, 31046/ඒ, 746/ඒ, 21615/ඒ සහ 18156/ඒ දරණ නඩු ඇසීමට සහ අසා අවසානකර තීන්දු දීම පිණිස කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/වී. 2/67.

කේ. වික්නරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඥාණචන්ද්‍රන් මහතා 1970 නොවැම්බර් මස 8 දින පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 13/69.

ඒ. එච්. ඊ. මොලමුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. බී. සංගක්කර මහතා 1970 නොවැම්බර් මස 1 සහ 2 දිනයන්හි පොලොන්නරුවේ ක්‍රියාකරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්සෙට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 13/69.

ඒ. එච්. ඊ. මොලමුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. බී. සංගක්කර මහතා 1970 ඔක්තෝබර් මස 31 සහ 1970 නොවැම්බර් මස 3 දින සිට 5 දින දක්වා පොලොන්නරුවේ ක්‍රියාකරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 2/67.

කේ. වික්නරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. රත්නසිංහම් මහතා 1970 නොවැම්බර් මස 5 වැනි දින පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 25/61.

ජේ. බී. සී. සවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. එම්. එල්. ද සිල්වා මහතා 1970 නොවැම්බර් මස 5 දින සිට නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජේ. 10/60.

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එම්. එම්. මුස්තපා මහතා 1970 ඔක්තෝබර් මස 31 දින මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 33/67.

ඒ. සයිමන් සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එච්. කරීම් මහතා 1970 ඔක්තෝබර් මස 30 සහ 31 දිනයන්හි නාරාහේන්පිට උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 22/59.

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එච්. අබේසේකර මහතා 1970 ඔක්තෝබර් මස 21 දින සිට 26 දින දක්වා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එෆ්. 3/65.

එෆ්. ජී. බී. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඒ. සී. වික්‍රමරත්න මහතා මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/වී. 1/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 ඔක්තෝබර් මස 31 දින යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 2/66.

ආර්. ඉලෙපෙරුම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඒ. බැස්චියන්ස් මහතා 1970 ඔක්තෝබර් මස 30 දින සිට නොවැම්බර් මස 1 දින දක්වා මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එච්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 ඔක්තෝබර් මස 23 දින සිට 27 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 13/67.

ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ඕ. එම්. තාහිර් මහතා 1970 ඔක්තෝබර් මස 21 දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 11/65.

ජේ. ජී. ආසිර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩී. සෙන්ට් ඊ. අමරසිංහ මහතා 1970 නොවැම්බර් මස 5 දින සිට 7 දින දක්වා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 නොවැම්බර් මස 5 දින සිට 7 දින දක්වා ගම්පොළ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොළ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 30/66.

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩී. සේරසිංහ මහතා 1970 නොවැම්බර් මස 5 දින සිට 8 දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්,

අංකය : ජේඑල්/ඩී. 29/66.

ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එන්. ජේ. වී. කුරේ මහතා 1970 නොවැම්බර් මස 4 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 29/66.

ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඊ. විජේතුංග මහතා 1970 නොවැම්බර් මස 5 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 11/62.

සී. ඊ. මෙන්ඩිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. ඊ. සී. පෙරේරා මහතා 1970 නොවැම්බර් මස 3 දින කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල-ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 17/68.

එම්. පී. විජේසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සීමම්පිල්ලේ මහතා 1970 නොවැම්බර් මස 10 දින සිට 13 දින දක්වා මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජේ. 12/62.

එස්. ජෝකනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ටී. එස්. පී. ද එස්. ගුණසේකර මහතා 1970 නොවැම්බර් මස 7 දින සිට 14 දින දක්වා බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 17/55.

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සිවගුරුනාදන් මහතා 1970 නොවැම්බර් මස 2 සහ 3 දිනයන්හි කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 28/65.

ජී. ජී. ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. ජේ. පොන්සේකා මහතා 1970 නොවැම්බර් මස 5 දින පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 11/64.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ජේ. පීරිස් මහතා 1970 නොවැම්බර් මස 3 දින සිට 6 දින දක්වා බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 1/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 නොවැම්බර් මස 7 සහ 8 දිනයන්හි යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 8/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ටී. ගුණරත්න මහතා 1970 නොවැම්බර් මස 11 දින පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61.

ජේ. යෝනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු රෙක්ස් වික්‍රමසිංහ මහතා 1970 නොවැම්බර් මස 7 සහ 8 දින ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 29/66.

ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඊ. විජේතුංග මහතා 1970 නොවැම්බර් මස 15 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්,

අංකය : ජේඑල්/ඩී. 21/59.

ඩී. ඊ. ධම්සේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඊ. විජේතුංග මහතා 1970 නොවැම්බර් මස 11 සහ 12 දිනයන්හි කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 35/67.

එච්. ඩබ්ලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ටී. එස්. බූල් මහතා 1970 නොවැම්බර් මස 14 සහ 15 දිනයන්හි හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 7/57.

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එම්. අබුතහිර් මහතා 1970 නොවැම්බර් මස 12 දින සිට 15 දින දක්වා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/13/48 (I).

එම්. එම්. විජේසූරිය මහතා 1970 නොවැම්බර් මස 23 දින දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 15692/බී දරණ නඩුවේ තීන්දුව දීම පිණිස කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල-ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 17/55.

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සිවගුරුනාදන් මහතා 1970 නොවැම්බර් මස 15 දින කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 47/48 (III).

තිස්ස ගුණරත්න මහතා 1970 නොවැම්බර් මස 18 දින පානදුර දි. උ. අංක 11632 දරණ නඩුව ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 34/67.

ජේ. සී. ඒ. සී. එම්. එස්. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඩී. රණසිංහ මහතා 1970 නොවැම්බර් මස 13 දින සිට 17 දින දක්වා ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 27/64.

එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සෝනාතිරාජා මහතා 1970 නොවැම්බර් මස 14 දින සිට 22 දින දක්වා මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/62.

කේ. වී. සවර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ඕ. එම්. තහිර් මහතා 1970 නොවැම්බර් මස 14 දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 24/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. කනගරත්නම් මහතා 1970 නොවැම්බර් මස 18 සිට 21 දක්වා යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 6/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ආර්. කුලතුංග මහතා 1970 නොවැම්බර් මස 27 දින මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එච්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 නොවැම්බර් මස 19 දින හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/63.

ඩී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. මතවරාජා මහතා 1970 නොවැම්බර් මස 11 දින සිට 13 දින දක්වා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 11/65.

ජේ. ජී. ආසිර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. ජී. ද සිල්වා මහතා 1970 නොවැම්බර් මස 11 වැනි දින සිට 14 වන දින දක්වා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 නොවැම්බර් මස 12 දින සිට 16 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේ.එල්/එන්. 5/61.

ඩී. එස්. නෙත්සිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. ජේ. ඩේවිඩ් මහතා 1970 නොවැම්බර් මස 24 සහ 25 දිනයන්හි මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61.

ජේ. සෝනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු රෙක්ස් වික්‍රමසිංහ මහතා 1970 නොවැම්බර් මස 9 දින ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 ඔක්තෝබර් මස 14 වැනි දින සිට 16 වැනි දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීආර්පී/එල්. 1/69.

අයි. එම්. ලියනගේ මහතා 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියෝගයක් කරන තෙක් බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කයේ බෙන්තොට-වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීආර්පී/කේ. 9/70.

එම්. එස්. කදුරුගමුව මෙනවිය 1970 නොවැම්බර් මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ සහ කුකුල් කෝරළේ ගම්බද උසාවි සභාපතිනිය සහ නවදුන් කෝරළේ ගම්බද උසාවි අතිරේක සභාපතිනිය වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. ඊ. පීන්තු මහතා 1970 සැප්තැම්බර් මස 30 වැනි දින පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු හා කඩවත් කල්පිටිය, රාජවන්නි සහ කුමාරවන්නි පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 11/64.

ඒ. ඩී. එම්. කේ. පෙතියාගොඩ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වීරතුංග මහතා 1970 ජූලි මස 7 දින සහ 8 වැනි දිනයන්හි මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 ඔක්තෝබර් මස 15 දින සිට 18 වැනි දින දක්වා වවුනියා සහ මන්නාරම් දිස්ත්‍රික්ක යන්හි වවුනියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/23/57.

සී. රාසයියා මහතා උඩුවිල් ගම්බද උසාවියේ අංක 3431 දරණ සිවිල් නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුවදීම පිණිස 1970 ඔක්තෝබර් මස 10 වැනි දින සිට යාපනය දිස්ත්‍රික්කයේ උතුරු වලිකාමම්, නැගෙනහිර වලිකාමම්, වඩමරච්චි සහ යාපනේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/8/57.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා වත්තේගම ගම්බද උසාවියේ අංක 7799 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස 1970 නොවැම්බර් මස 18 වැනි දින සිට මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩ දුම්බර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/8/57.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා වලල ගම්බද උසාවියේ අංක ව. අ. 6123 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස 1970 නොවැම්බර් මස 16 වැනි දින සිට මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර උඩ දුම්බර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/බී. 7/59.

සුධර්මා ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඩී. සී. කුමාරගේ මහතා 1970 ඔක්තෝබර් මස 11 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ, පහත බුලත්ගම, අටඑගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ සහ කුරුවිටි කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 7/56.

එන්. වී. ටී. මෙන්දිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. ජේ. සහිඩ් මහතා 1970 ඔක්තෝබර් මස 17 සහ 18 දිනයන්හි පානදුර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ සහ පානදුර තොටමුනේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/සී. 2/62.

සී. ඒ. එස්. ඊ. ක්‍රිස්පින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1970 ඔක්තෝබර් මස 27, 28, 30 සහ 31 දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ යන් හි ගම්බද උසාවි සභාපති සහ ගල්ගමුව, නිකවැරටිය, කුලිය පිටිය, පන්නල, බිංගිරිය, හිරියාල හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සී. ජබාර් මහතා 1970 ඔක්තෝබර් මස 30 දින කල්මුනේ දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජේ. 6/63.

කේ. ජී. ජයසේන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. ඒ. යටවර මහතා 1970 ඔක්තෝබර් මස 30 දින සිට 1970 නොවැම්බර් මස 2 දින දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ සහ නැගෙනහිර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. එල්. මාලවන මහතා 1970 ඔක්තෝබර් මස 27 දින රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/4/57.

එන්. ඩබ්ලිව්. රාජකරුණා මහතා මුගුරුගම්පල ගම්බද උසාවියේ අංක 10792 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස 1970 ඔක්තෝබර් මස 17 දින සිට ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ, බටහිර සියනෑ කෝරලේ මැද පත්තු සහ හාපිටිගම් කෝරලේ සහ දකුණු අලුත්කුරු කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේකිව්/ඒ. 20/70.

එස්. එල්. එම්. අබ්දුල් කාදර් මහතා 1970 නොවැම්බර් මස 2 දින සිට තුන් අවුරුදු කාලසීමාවකට යටත්ව මඩකලපු දිස්ත්‍රික්කයේ එරවූර් ආදායම් කොට්ඨාශය තුළ කාතිවරයෙකු වශයෙන්.

එල්. සමරතුංග,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
වැඩබලන ලේකම්.

1970 නොවැම්බර් මස 20 ද,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

11-1057/1

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද අවලංගු කිරීම්

1970 දෙසැම්බර් මස 30 දින සිට ඩී. කයු. එම්. සිරිමාන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කොළඹ දි. උ. අංක 70358/එම්, 69530 එම්, 71497/එම්, සහ බී/42 දරණ නඩු අවසානකර තීන්දුවදීම පිණිස කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන් දී ඇති පත්වීම මෙයින් අවලංගු කරන ලදී.

1970 සැප්තැම්බර් මස 28 වැනි දින සී. ජී. එල්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරලේ, බටහිර හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ සහ කොළඹ ප්‍රාදේශීය ආදායම් පාලක කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හර්බට් ඩබ්ලිව්. වීරපුර මහතාට දී ඇති පත්වීම මෙයින් අවලංගු කරන ලදී.

එල්. සමරතුංග,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
වැඩබලන ලේකම්.

1970 නොවැම්බර් මස 20 ද,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

11-1057/2

# වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 388**

සා 4/සාවි.නිල. 51.

### අධිකරණ ආඥාපනත

82 වන වගන්තිය යටතේ දැන්වීම

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

(1) එච්. ඩී. පෙරේරා මහතා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නීති උපදේශක ධුරය දරණ කාලය තුළ දිවයිනේ සියළුම අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන්,

පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 නොවැම්බර් 17 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දිය.

11-955/1

**1970 අංක 389**

සා 4/සාවි/නිල/11., සා 4/සාවි 7/69., සා 4/සාවි 9/203., සා 4/සාවි 35/87., සා 4/සාවි 2/399, සා 4/සාවි 40/15., සා 4/සාවි 16/118, සා 4/සාවි 5/63., සා 4/සාවි 15/52.

### අධිකරණ ආඥාපනත

82 වන වගන්තිය යටතේ දැන්වීම

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

1. ජූනියස් එඩ්වඩ් කොරයා මහතා කොළඹ මහ නගර සභාවේ ලේකම් ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

2. සෙල්ලපෙරුමගේ ජිනේන්ද්‍රදාස මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

3. ජිනදාස කොමිසාරු මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

4. වෙදමුල්ල මුදියන්සේගේ සමරසිංහ මහතා බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

5. ගලඇල්ලූ විතාරණලාගේ මොදියස් බණ්ඩාර මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

6. හපු හැන්නදිගේ නන්දසිරි මහතා මොණරාගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

7. විල්මට් ඩයස් ගුණසීල ජයවර්ධන මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

8. ලිදමුලගේ එමලියානු සිල්වා මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

9. ආරියපාල පෙත්තාවඩු මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 නොවැම්බර් 17 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-955/2

---

**1970 අංක 390**

පා 4/සාවි 20/26.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරයවූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

1. පැව්ලන් සෙබමාලෙයි සින්නදුරෙයි මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා,

සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් කර ඇති පත්වීම වහාම ක්‍රියාත්මක වනසේ මෙයින් අවලංගු කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 නොවැම්බර් මස 19 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-1093

---

**1970 අංක 391**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඔලිවර් නිව්ටන් වදුරාගල මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ නොවැම්බර් මා 7 වැනි දින,
කොළඹ දී ය.

11-960

---

# ආණ්ඩුවේ නිවේදන

## ජනලේඛන ආඥාපනත

143 වැනි අධිකාරය වන ජනලේඛන ආඥාපනතෙහි 2 වැනි වගන්තිය යටතේ ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යවරිය විසින් පනවනු ලබන ආඥාවයි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය හා
ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍ය.

1970 නොවැම්බර් මස 17 දින,
කොළඹ දී ය.

**ආඥාව**

ලංකා වාසීන්ගේ සමාජයීය, පොදු හා ආර්ථික තත්වයන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා එක්දහස් නවසිය හැත්තෑ එකේ වර්ෂයේ දී දිවයිනේ,

(අ) ජනගහණය සහ,

(ආ) නිවාස පිළිබඳ ලේඛනයක් ගත යුතු බව මෙයින් නියම කරනු ලැබේ.

11-1107/1

---

## ජනලේඛන ආඥාපනත

වර්ෂ 1970 නොවැම්බර් මස 27 වැනි දින අංක 14,934 දරණ ගැසට් නිවේදනයේ ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යතුමිය විසින් ප්‍රකාශයට පත් කරන ලද ආඥාව පරිදි, වර්ෂ 1971 දී ගත යුතුයැයි නියමිත සංගණනය පරිපාලනය කිරීම පිණිස සංගණන අධිකාරී ලෙස, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ලෙස්ලි බර්ට්‍රම් රාජකරුණා මහතා ජනලේඛන ආඥාපනතේ (143 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යතුමිය විසින් පත් කොට ඇත.

එච්. ඒ. ද ඇස්. ගුණසේකර,
ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 17 දින,
කොළඹ දී ය.

11-1107/2

---

රා. ආ. වි./ලේ.—ඊ/ප 20/189 (70).

ඇල්.ඩී.—බී. 32/40.

## අපරාධ නඩු විධාන සංග්‍රහය

**2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුවේ පිහිටුවන ලද මුරපොළ, පොලිස් ස්ථානයක් බවට (20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 14 වන දින,
කොළඹ දීය.

11-961

---

## මිල පාලන ආඥාව

නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය) අයි.ඕ.කේ.ජී. ප්‍රනාන්දු විසින් පනවනු ලැබ, 1970 ඔක්තෝබර් මස 21 වැනි දින අංක 14,928/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ (විවිධ ද්‍රව්‍ය) මිල පාලනයට අදාල පහත සඳහන් ආඥාවන්, වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ:—

(1) 1970 අංක 1 දරණ (සබන්) මිල පාලන ආඥාව
(2) 1970 අංක 1 දරණ (කමිස) මිල පාලන ආඥාව
(3) 1970 අංක 1 දරණ (අභ්‍යාස පොත්) මිල පාලන ආඥාව
(4) 1970 අංක 2 දරණ (දන්තාලේප වියුබ්) මිල පාලන ආඥාව
(5) 1970 අංක 2 දරණ (විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි) මිල පාලන ආඥාව.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් 4 දින.
කොළඹ දී ය.

11-857/1

## මිල පාලන පනත

(විවිධ ද්‍රව්‍ය) මිල පාලක විසින් පනවනු ලැබ 1970 ඔක්තෝබර් මස 17 වෙනි දින, අංක 14,928/1 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1970 අංක 6 දරණ මිල පාලන (ආනයනය කරන ලද රෙදි පිළි) ආඥාව, වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් 4 දින,
කොළඹ දී ය.

11-857/2

---

## රජයේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත (352 පරිච්ඡේදය)

1949 වර්ෂයේ, අන්‍යොන්‍ය ඇප සඳහා ලංකාවේ රජයේ නිලධාරීන්ගේ සංගමයේ ව්‍යවස්ථා මාලාවට පහත දැක්වෙන සංශෝධනය 1970 ජූනි 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු මුදල් ඇමති තුමා විසින් අනුමත කරන ලදී :—

6 (1) (අ) ව්‍යවස්ථාවේ දැක්වෙන "රජයේ වැඩ නියෝජ්‍ය අධ්‍යක්ෂ" යන වචන කපා හැර ඒ වෙනුවට "නිරවුල් කිරීමේ නිලධාරි" යන වචන යොදන්න.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

11-877

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සෝමපාල දිසානායක මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 8 වැනි දින,
කොළඹ දීය.

11-1014

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් කටයුතු කිරීමට බලයලත් වෙල්ලප්පා ආරුමුගම් මහතාගේ නොතාරිස් බලපත්‍රය (107 වන අධිකාරය වන) නොතාරිස් ආඥා පනතේ 21 (2) වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් 1970 සැප්තැම්බර් මස 24 වෙනි දින සිට අවලංගුකර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 30 වැනි දින,
කොළඹ දීය.

11-841

---

ඇල්.ජී.—බී. 124/42.

## ලංකා තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකු ආඥාපනත

### දැන්වීම

(191 වැනි අධිකාරය වන) ලංකා තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකු ආඥාපනතේ 7 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තැපැල් සහ විදුලි සංදේශ ඇමති, වෙල්ලයියා කුමාරසූරියර් වන මම, මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ලංකා තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකුවට තැන්පතු වශයෙන් ගෙවන ලද මුදල් වලට ගෙවිය යුතු පොලිය 1971.1.1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වර්ෂයකට රුපියල් සීයයට රුපියල් හතයි ශත විස්සේ ප්‍රමාණයට වන ලෙස මෙයින් නියම කරමි.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970 නොවැම්බර් 12 වන දින,
කොළඹ දී ය.

11-861

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ, 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1968 සැප්තැම්බර් 27 වැනි දින අංක 14,821 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 1 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ උඩපළාත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) රූපහ විද්‍යාවිලාස පිරිවෙනහි, රූපහ පූජ්‍ය ගරු පණ්ඩිත සද්ධානන්ද, වලපනේ සංඝනායක ස්වාමීන් වහන්සේ.

(2) හල්ගුන්ඔය, මන්ත්‍රීතැන්න, ශ්‍රී විවේකාරාමයේ පූජ්‍ය ගරු පණ්ඩිත වැවේගම සාසනසිරි ස්වාමීන් වහන්සේ.

(3) කුරුපනාවෙල, සුනන්දාරාමයේ පූජ්‍ය වැතලාවේ ආරිය වංශ ස්වාමීන් වහන්සේ.

(4) කුරුපනාවෙල, ගාලේතැන්න ගෙදර පදිංචි හේරත් මුදියන්සේලාගේ සුගතපාල මහතා.

(5) රූපහ, පින්නපිටියේ ගෙදර පදිංචි විජේසේකර මුදින්සේලාගේ පුංචි බණ්ඩා මහතා.

(6) රූපහ, පිරිවෙනහි, කළුබණ්ඩා රත්නායක මහතා.

(7) රූපහ, ඇඹුලන්පහ, අඹලියද්ද පදිංචි අළුත්ගෙදර එන් දෝරිස් මහතා.

(8) රූපහ, අඹලියද්ද පදිංචි හේරත් මුදියන්සේලාගේ සෝමාවතී මහත්මිය.

(9) උඩපුස්සැල්ලාව, ගල්කඩපතන පදිංචි මහරණවකගේ පොඩිහාමිනේ මහත්මිය.

(10) කුරුපනාවෙල, ගාලේතැන්න පදිංචි හේරත් මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා.

(11) කුරුපනාවෙල, වතුලන්ද පදිංචි වරුෂහැන්නැදිගේ ජෝන් සොයිසා මහතා.

(12) උඩපුස්සැල්ලාව, සාන්ත මාග්‍රට්හි කළුතර ආචාරිගේ සුමනපාල මහතා.

(13) හල්ගුන්ඔය, රත්නායකපුර පදිංචි බෝගහවත්තේ සමරසේකර මුදියන්සේලාගේ ධර්මදාස මහතා.

(14) ගුරුපනාවෙල, වටගොඩගෙදර පදිංචි වතුලන්දේගෙදර රත්නායක මුදියන්සේලාගේ පියදාස මහතා.

(15) රූපහ, හපුගස්තැන්න පදිංචි විජේකෝන් මුදියන්සේලාගේ පියසේන මහතා.

(16) කුරුපනාවෙල, මීපනාව, "ශාන්ති" හි පදිංචි විජේකෝන් මුදියන්සේලාගේ මඩුගස්තැන්නේ පුංචි බණ්ඩා මහතා.

(17) රූපහ, අඹලියද්ද පදිංචි ගාල්ලේ පතිරණගේ සුනිල් කුමාරදාස මහතා.

(18) හල්ගුන්ඔය, රාගල වී. සී. කාර්යාලයේ ලයනල් රණසිංහ මහතා.

(19) උඩපුස්සැල්ලාව, ගල්කඩපතන පදිංචි කොඩිතුවක්කුගලගේනගේ ගාමිණී ධර්මසේන මහතා.

(20) කුරුපණාවෙල, පංසලේ ගෙදර පදිංචි පංසලේ ගෙදර හේරත් මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා.

(21) කුරුපනාවෙල, මීපනාව, "වෙදනිවස" හි පදිංචි දිඹුල්පිටියේගෙදර විජේකෝන් මුදියන්සේලාගේ ආරිය රත්න මහතා.

(22) රුපහ, කොටඹේ පාළුගම පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ විජේරත්න මහතා.
(23) රුපහ, පහළගම පදිංචි රත්නායක මුදියන්සේලාගේ හීන් අප්පුහාමි මහතා.

(ආ) කුරුපනාවෙල, ගාලේතැන්න ගෙදර පදිංචි හේරත් මුදියන්සේලාගේ සුගතපාල මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-956

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

1970 සැප්තැම්බර් මස 1 දින සිට අවුරුදු 3 ක කාලයක් තුළ වී කෙටීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් ලෙස සේවය කිරීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි පරිච්ඡේදය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගේගලි මොරගොඩ,
ස්ථිර ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

1970 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දීය.

**නම නියමකොට පත්කරන ලද සාමාජිකයෝ :**

1. පී. ඒකනායක මහතා
2. එස්. ඒජ්. ද සිල්වා මහතා
3. බී. එල්. රණසිංහ මහතා

**සේවා නියෝජිතයන් :**

1. ඒ. එච්. ටී. ඩේසන් සිල්වා මහතා
2. ආර්. එස්. විජේතුංග මහතා
3. හෙන්රි දේවරාජ මහතා
4. ජේ. එච්. කරුණාරත්න මහතා
5. දොස්තර එච්. සී. එච්. සොයිසා මහතා
6. එම්. බී. අබේවර්ධන මහතා
7. සිරි සමරසිංහ මහතා
8. එස්. එම්. බී. අබ්දුල් කාදර් මහතා
9. ඩී. ඩබ්ලිව්. නානායක්කාර මහතා
10. ඒ. එම්. පී. වින්සන්ට් සිල්වා මහතා
11. ඒ. සී. එම්. තෞපික්

**සේවක නියෝජිතයින් :**

1. එස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
2. ටී. ගුරුනාදන් මහතා
3. ඔස්වින් ප්‍රනාන්දු මහතා
4. එස්. සෙල්ලයියා මහතා
5. වෝල්ටර් ජෝනිපාල මහතා
6. එස්. සෙල්ලසාමි මහතා
7. පී. ලියනගේ මහතා
8. ඒ. යුසුබ් ලෙබ්බෙ මහතා
9. කේ. තුරෙයිරාස මහතා
10. ඩී. හෙන්රි මහතා
11. එල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා

11-853

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### රත්නපුර ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන්වන කාල සීමාවට සුරංගනී එල්ලාවල මහත්මිය රත්නපුර ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකාවක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 14 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

11-1075

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### බදුල්ල ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන්වන කාල සීමාවට පහත සඳහන් අය බදුල්ල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 14 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

**නාම ලේඛනය**

(1) වීරසේකර යාවරම්මාන මහතා.
(2) වී. එම්. බී. මල්වානගේ මහතා.

11-1076

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### ගාල්ල ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන්වන කාල සීමාවට ඇම්. වහාබ් මහතා ගාල්ල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 17 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

11-1077

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### මහනුවර ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වෙනිදායින් අවසන් වන කාල සීමාවට අයි. කුද්දූස් මහතා මහනුවර ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 11 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

11-840

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### හැඳල ලාදුරු ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය හැඳල ලාදුරු ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් ඒ. ජේ. ජී. ප්‍රනාන්දු මහතා නම් කරනු ලැබීය.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 11 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**නාමලේඛනය**

1. ඒ. ජේ. ජී. ප්‍රනාන්දු මයා, (සභාපති)
2. ඒ. සී. ඩිල්බට් මයා.
3. පී. ඇස් විජේගුණවර්ධන මයා.
4. සී. සී. ඒ. නික්ලස් මයා.
5. ඇල්. ඒ. විජේසිංහ මයා.
6. වෛද්‍ය ඇස්. ද ඇස්. ජයසිංහ මයා.
7. ඇන්. ඇස්. පෙරේරා මයා.
8. එච්. එල්. හල්දේරා මයා.
9. එච්. ආර්. සෙනෙවිරත්න මයා.
10. ඩබ්ලිව්. ආර්. ටී. ප්‍රනාන්දු මයා.
11. ආයුර්වේද වෛද්‍ය කේ. ජී. ජයවීර මයා.
12. ඇල් ප්‍රඩ් ගුණවර්ධන මයා.
13. ලාදුරු මර්ධන ව්‍යාපාරයේ අධිකාරි
14. දිස්ත්‍රික් ඉංජිනේරු, දකුණු කොළඹ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කොළඹ 7.

11-842

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

#### නාම ලේඛනය

(1) ඇල්. ඊ. පී. රාජකරුණා මහතා.
(2) මීනා රත්නම් මහත්මිය, නාගරික මන්ත්‍රිනී.
(3) ප්‍රැන්සිස් ජයවර්ධන මහත්මිය.

11-923

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### යාපනය ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වන කාලසීමාවට වී. රාජසුන්දරම් මහතා යාපනය ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත්කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

11-922

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### දකුණු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය දකුණු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 16 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

#### නාම ලේඛනය

(1) ආනන්ද ප්‍රේමසිංහ මහතා, නාගරික මන්ත්‍රී.
(2) බන්දුජීව පෙරේරා මහතා, නාගරික මන්ත්‍රී.
(3) සී. එල්. ප්‍රේමරත්න මහතා.

11-921

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

තංගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට බලය ලත් ආනන්ද අතපත්තු මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ නොවැම්බර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

11-957

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට බලය ලත් කාසිනාදර් සිවපාලන් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ නොවැම්බර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

11-958

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට බලය ලත් දේවලක්ෂ්මී බාල සුන්දරම් මහත්මියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ නොවැම්බර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

11-959

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

ප්‍රවාහන අමාත්‍ය ධූරන්ධර ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනා ගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කරගැනීමට යෝජනාකර ඇත්තාවූද නිශ්චල දේපොළ අත්කරගැනීමේ, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1970.11.15 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කෝට්ටේ නගර සභා සීමාව තුල, උඩහමුල්ල ග්‍රාම සේවක නිලධාරි කොට්ඨාශයේ, උඩහමුල්ල නම් ග්‍රාමයේ ප්‍රමාණයෙන් අ. 7, රූ. 2, ප. 0 පමණ වන ඉඩම් කොටසක්.

(1) උතුරට: ගංගොඩවිල, සුභොධාරාමයේ, පූජ්‍ය දේවමිත්ත ස්වාමීන් වහන්සේට අයිතියයි කියන ඉඩමය;

නැගෙනහිරට: පැරණි කොට්ටාව මහා මාර්ගය;

දකුණට: (1) මරදානේ, නැෂනල් මෝටර් ස්ටෝර්ස් හිමි ගුණතිලක සහ සහෝදරයින්ට අයිතියයි කියන ඉඩම, (2) උඩහමුල්ල, රොබින්සන් ජයවීරට අයිතියයි කියන ඉඩම, (3) අත්කගරනු ලබන ඉඩමේ ඉතිරි කොටස;

බස්නාහිරට: ඇඹුල්දෙනිය, උඩහමුල්ල, පැරණි කොට්ටාව පාරේ, ඩී. ජේ. එදිරිසිංහට අයිතියයි කියන ඉඩමය.

යන මේ මායිම් තුල පිහිටියේය.

(2) අත්කරගැනීමට ඇති ඉඩම පිළිබඳ විස්තර මෙසේය:

ඉඩමේ නම: කුරුඳුවත්ත, නො. 390, පැරණි කොට්ටාව පාර; විස්තරය: පදිංචි නිවාස හයක් සහිත පොල් ඉඩමක්; අයිතිය ප්‍රකාශ කරන්නාගේ නම හා ලිපිනය: ඩේවිඩ් ජෝරිස් එදිරිසිංහ, නො. 390, උඩහමුල්ල, නුගේගොඩ; ප්‍රමාණය: අ. 7, රූ. 2, ප. 0 පමණය.

11-888

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ජූලි 20 දින අංක 14,915/4 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 14 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කුඹුකපත්තු ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) ගෝනපොල හන්දිය, තලගල, මීපාගල පදිංචි ගමගේ දිනෝරිස් මහතා.
(2) ගෝනපොල හන්දිය, ඔලබොඩුව පදිංචි යූ. ඩී. ඒමිස් රාලහාමි මහතා.
(3) ගෝනපොල හන්දිය, පලන්තොරුව පදිංචි වයි. දයාරත්න පෙරේරා මහතා.
(4) ගෝනපොල හන්දිය, කුඹුක බටහිර පදිංචි ගොරොක් ගොඩගේ චන්ද්‍රා ප්‍රේමතිලක මහත්මිය.
(5) පොකුණුවිට, හේනේගම, "ජයන්ති" යි පදිංචි ජාතුන්ගේ කරුණාරත්න මහතා.
(6) හොරණ, කනන්විල, "ඉන්දැනි" හි පදිංචි කිදෙල් පිටියගේ එලියෙස් පෙරේරා මහතා.
(7) හොරණ, අරමනාගොල්ල, අංක 115 හි පදිංචි කරන්නා ගොඩගේ වේලාරත්න මහතා.
(8) හොරණ, කබල්ලාගොඩ "සන්ධ්‍යා" හි පදිංචි අලුත්ගේ දෙන් සිරිසේන මහතා.
(9) හොරණ, අම්බාගල, "ජයන්ති" හි පදිංචි සම්පච්ච සමරප්පුලිගේ ජේම්ස් ප්‍රනාන්දු මහතා.
(10) හොරණ, මාහේන, "සිසිකිරණ" හි පදිංචි දොන් චන්ද්‍රසේන වෙල්ගම මහතා.
(11) කුඩා උඩුව, දකුණු උඩුව පදිංචි ගුණරත්න විල්පිට මහතා.
(12) හොරණ, මූණගම පදිංචි බී ඩී. රොබට් ගුණසේකර මහතා.
(13) කුඩා උඩුව, අඩවිය පදිංචි එච්. ඩී. වාරිස් මහතා.
(14) කනන්විල, කහටපිටිය පදිංචි ඇම්. ඩී. දිලෝසිංඤෝ මහතා.
(15) ගෝනපොල හන්දිය, තලගල පදිංචි ඇම්. සෝමදාස මහතා.
(16) පොකුණුවිට, වැලිගම්පිටිය පදිංචි ශාස්ත්‍රාචාර්ය ජී. ඩී. ලූවිස් මහතා.
(17) බණ්ඩාරගම, හේන්ගොඩ පදිංචි වෛද්‍යාචාර්ය එච්. ඩී. බී. ගුණතිලක මහතා.
(18) වැල්මිල්ල හන්දිය, වැල්මිල්ල පදිංචි පී. ඩී. පෙරේරා මහතා.

(ආ) ගෝනපොල, තලගල, මීපාගල පදිංචි ගමගේ දිනෝරිස් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

(ඉ) අංක 14,882 හා 1969. 11. 28 දින දරණ ගැසට් නිවේදනයෙන් පත් කරන ලද සමගිදායකයින්ගේ සභාව, මේ ආඥාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට අහෝසි වේ.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-1009/1

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමඟ කිය විය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ පහත සඳහන් සාමාජිකයින් නිලයෙන් ඉවත් කරමි :—

(1) ගොඩකවෙල, වැල්කැනියාය, විහාරාධිපති පූජ්‍ය වැල්කැනියායේ ධම්මසේන ස්ථවිරයන් වහන්සේ.
(2) අටකලන්පන්න, මාදම්පේ පදිංචි මල්ලිකා මහවෙල මහත්මිය.
(3) අටකලන්පන්න, මාකඳුර පදිංචි සුදුහුම්පොල නානායක්කාර මොහොට්ටාල ඩියුක් ලැනරෝල් කමලාවතී මැණිකේ මහත්මිය.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 17 වැනිද,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-1009/2

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සභාපති, ගොඩකවෙල පදිංචි හිරිපිටියගේ විලියම් සිල්වා මහතා නිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 17 වැනිද,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-1009/3

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි අටකලන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපතිව සිට එම ධුරයෙන් ඉවත් කරන ලද ගොඩකවෙල පදිංචි හිරිපිටියගේ විලියම් සිල්වා මහතා වෙනුවට, ගොඩකවෙල, ගලහිටිය පදිංචි රත්නායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩාර මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 17 වැනිද,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-1009/4

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරන පනතින්

සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩලපනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 ජූලි මස 20 දින අංක 14,915/4 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතේ වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 46 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කෑගල්ල නගර සහ ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කෑගල්ල, වැලිමන්නාතොට පදිංචි අමරදාස ලේකම්ගේ මහතා.
(2) කෑගල්ල, පරන, රෝහල පාරේ පදිංචි කරුණාරත්න අබේසිංහ මහතා.
(3) කෑගල්ල, සමාජශාලා පාර, අංක 25/3 හි පදිංචි සම්සදීන් මොහමඩ් බුහාරි මහතා.
(4) කෑගල්ල, ආයුර්වේද භවන හි පදිංචි රාලලාගේ පොඩිරාල හාමි ගල්කඩුව මහතා.
(5) කෑගල්ල, ඩොමිනියන් ගරාජයෙහි ප්‍රේමන් සමරසිංහ මහතා.
(6) කෑගල්ල, අඹන්පිටිය පදිංචි රනතුංග මුදියන්සේලාගේ මද්දුම බංඩාර මහතා.
(7) කෑගල්ල, කෙලින් විදියේ පදිංචි තුඩුගල මුදලිගේ විලියම් ප්‍රනාන්දු මහතා.
(8) කෑගල්ල, කෙලින් විදියේ පදිංචි බොඩිපිහිටුවල රාමණා යකගේ චන්ද්‍රසේන මහතා.
(9) කෑගල්ල, රන්වල පදිංචි දෝන මේරි නෝනා අබේසිංහ මහත්මිය.
(10) කෑගල්ල, පොල්ගහවෙල පාරේ පදිංචි වේදසේන සමරසිංහ මහතා.
(11) කෑගල්ල, පන්සල පාරේ පදිංචි පියතිස්ස කුමාරසිංහ මහතා.
(12) කෑගල්ල, වැලිමන්නාතොට පදිංචි පෙරුම්බුලි ආරච්චිල්ලා බුද්ධදාස මහතා.
(13) කෑගල්ල, මීපිටිය පදිංචි දොන් ඇලෝසියස් මල්ලව ආරච්චි මහතා.
(14) කෑගල්ල, මාදෙයියාව පදිංචි, පුරුදුනායක වඩුගේ අබේරත්න මහතා.
(15) කෑගල්ල, කුරුඳුහින්න පදිංචි බඹරගමගේ එඩ්මන්ඩ් බඹරගම මහතා.
(16) කෑගල්ල, මීපිටිය පදිංචි තෙබුවනගේ ගුණරත්න මහතා.
(17) කෑගල්ල, පිටිහුම පදිංචි හේරත් බංඩා සමරතුංග මහතා.
(18) කෑගල්ල, පින්නගොල්ල පදිංචි පිකිරි බංඩා සේනානායක මහතා.
(19) කෑගල්ල, මහ විදිය, අංක 89 හි පදිංචි මොහොමඩ් ෂෙරීෆ් මොහොමඩ් මන්සූර් මහතා.
(20) කෑගල්ල, රන්වල මහා විද්‍යාලයෙහි අතුකෝරාල්ලාගේ හේරත් අතුකෝරල මහතා.
(21) අඹන්පිටිය, "අග්‍රා" හි පදිංචි සෙනෙවිරත්න කන්කන් ගරගේ ප්‍රාන්සිස් පෙරේරා මහතා.
(22) කෑගල්ල, රන්වල පදිංචි ඇලන් වෝල්ටර් හරිස්චන්ද්‍ර දිසානායක මහතා.
(23) කෑගල්ල මහ විදියේ පදිංචි සුරසේන සමරසිංහ මහතා.
(24) කෑගල්ල, දික්හේන පදිංචි සිරිල් මුනසිංහ මහතා.

(ආ) කෑගල්ල, වැලිමන්නාතොට පදිංචි අමරදාස ලේකම්ගේ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-1009/5

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩලපනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 මාර්තු 26 වැනි දින අංක 14,899 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 8 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ හාලිඇල සුළු නගර සහා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) හාලිඇල, සිරිබිම්බාරාම වාසී පූජ්‍ය මාවුස්සාගොල්ලේ ධම්මිස්සර ස්ථවිරයන් වහන්සේ.
(2) හාලිඇල, ඒකනායක මාවතෙහි පදිංචි වනසිංහ මුදියන් සේලාගේ කිරි බණ්ඩා ගල්කැටිය මහතා.
(3) හාලිඇල, "සිරිසර" හි පදිංචි දික්ගහ රනවක ආරච්චිගේ ප්‍රේමදාස මහතා.
(4) හාලිඇල, අන්තලාව පදිංචි ජයසේන සමරසේකර මහතා.
(5) හාලිඇල, ගල්කැටිය පදිංචි, දියගුබඩතුරුගේ කරුණාපාල ද සිල්වා මහතා.
(6) හාලිඇල, "සඳවිලා" හි පදිංචි හිත්තාදර මැක්රේ ප්‍රේම දාස මහතා.
(7) හාලිඇල, "ධම්මිකා" හි පදිංචි ඇම්. ඩබ්ලිව්. ඩී. ද සිල්වා මහතා.
(8) හාලිඇල, අමෑදමල්ලි කොටස පදිංචි පලනියන්ඩි මොට්ටයප්පන් මහතා.
(9) හාලිඇල, බණ්ඩාරවෙල පාර, අංක 1 හි පදිංචි අබ්දුල් කපූර් මොහමඩ් තාසිම් මහතා.
(10) හාලිඇල, මැද පිටිගම පදිංචි අත්තනායක මුදියන්සේලාගේ විලියම්සිංඤෝ මහතා.
(11) හාලිඇල, වලව්වත්ත පදිංචි දිසාවේ මුදියන්සේලාගේ ගුණසේකර මහතා.
(12) හාලිඇල, ගම්පහ බෙහෙත් ශාලාවෙහි ඇල්. ආර්. ඇම්. බී. කරුණාරත්න මහතා.
(13) හාලිඇල, "තුරු සිසිල" හි පදිංචි ඩී. ඇම්. කරුණාපාල මහතා.
(14) හාලිඇල, ඒකනායක මාවත හි පදිංචි කේ. ටී. ඇම්. අප්පුහාමි මහතා.
(15) හාලිඇල, අංක 82, "විමල්කාන්ති" හි පදිංචි කේ. වී. ගුණවර්ධන මහතා.

(ආ) හාලිඇල, ඒකනායක මාවතෙහි පදිංචි වනසිංහ මුදියන්සේලාගේ කිරි බණ්ඩා ගල්කැටිය මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-1009/6

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 17 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ, 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1969 දෙසැම්බර් 26 වන දින අංක 14,886 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 3 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ හැඳල සුළු නගර සහා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) වත්තල, හේකිත්ත පදිංචි ඒ. ජේ. ගිල්බට් ප්‍රනාන්දු මහතා.
(2) හැඳල, පල්ලියවත්ත, අංක 298 හි පදිංචි එදිරිසූරිය මොහොට්ටිගේ නිකලස් ඔගස්ටින් ද සේරම් මහතා.

(3) වත්තල, පල්ලියවත්ත, කිරළගස්දෙනිය, අංක 101/4 හි පදිංචි පලිහක්කාරගේ දොන් පීටර් ඇලක්සන් හර්මන් ද සිල්වා මහතා.

(4) වත්තල, දික්ඕවිට, අංක 422 හි පදිංචි පලියවඩන ආරච්චිගේ සිරිල් පෙරේරා ජයවර්ධන මහතා.

(5) වත්තල, හේකිත්ත පදිංචි මගගේ ෂෙල්ටන් පොලිකාෂ් ප්‍රනාන්දු මහතා.

(6) වත්තල, හේකිත්ත පදිංචි වලගම්පලගේ ලාසරුස් සිල්වා මහතා.

(7) වත්තල, හේකිත්ත, අංක 154 හි පදිංචි ජෝර්ජ් එම්මානුවෙල් ඇන්ටන් ධම්රත්න මහතා.

(8) වත්තල, කෙරවලපිටිය, පරණවත්ත පාර, අංක 18 හි පදිංචි රණවක් ආරච්චිගේ සෝමරත්න ද අල්විස් මහතා.

(9) වත්තල, කෙරවලපිටිය, අංක 352/5 හි පදිංචි දෙයාලගේ දොන් ෆ්‍රෙඩ්රික් අප්පුහාමි මහතා.

(10) වත්තල, කෙරවලපිටිය, ශාන්ති පාර, අංක 128 හි දොන් විල්බට් ජයසූරිය මහතා.

(11) වත්තල, මරදාන පාර, අංක 18 හි පදිංචි අමරකෝන්ගේ දොන් විල්බට් මහතා.

(12) වත්තල, මාටාගොඩ, ක්‍රිස්තු රාජ මාවත, අංක 47 හි පදිංචි මාදිවලගමගේ දොන් පැට්රික් පෝල් මහතා.

(13) වත්තල, මාටාගොඩ, අංක 46 හි පදිංචි පුලක්කුට්ටි ආරච්චිගේ දොන් ලැම්බට් ජෙරාඩ් මහතා.

(14) වත්තල, මාටාගොඩ, අංක 75 හි පදිංචි උඩුදේව ආරච්චිගේ දොන් සිල්වෙස්ටර් මහතා.

(15) වත්තල, තිඹිරිගස්යාය, මරදාන පාර, අංක 29/21 හි පදිංචි ඇන්ටනී සී. වීරසිංහ මහතා.

(16) වත්තල, තිඹිරිගස්යාය, බලගල පාර, අංක 31 හි පදිංචි කැරැම්ගොඩගේ දොන් බර්නාඩ් ජයවර්ධන මහතා.

(17) වත්තල, තිඹිරිගස්යාය, කසගහ පාර, අංක 304 හි පදිංචි කහඳවිටගමගේ දොන් ඇල්ප්‍රඩ් සිසිල් වික්ටර් ගුණවර්ධන මහතා.

(18) වත්තල, තිඹිරිගස්යාය, වැලිඅමුණ පාර, අංක 56 හි පදිංචි හරම්ගේ බෙනට් ප්‍රේමරත්න මහතා.

(19) වත්තල, හැඳල, අංක 287 හි පදිංචි මේරි ක්ලෙයාර් මාලනී අබේසේකර මහත්මිය

(20) වත්තල, හැඳල, ශාන්ති පාර, අංක 35 හි පදිංචි දොන් සිම්පිලීනු අමරසිංහ මහතා.

(21) වත්තල, හැඳල, නායකකන්ද, අංක 175/5 හි පදිංචි වින්සන් ජෝශප් පෙරේරා මහතා.

(ආ) වත්තල, හේකිත්ත පදිංචි ඒ. ජේ. ගිල්බට් ප්‍රනාන්දු මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-1009/7

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ, 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8), හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 මැයි 8 වන දින අංක 14,905 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 2 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ වත්තල-මාබෝල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) වත්තල, මීගමු පාර, අංක 416 හි පදිංචි ඉලුක්සූරිය ආරච්චිගේ රේමන් පෙරේරා මහතා,

(2) වත්තල, දුම්රියපොල පාර, අංක 63බී පදිංචි බෝපේ ආරච්චිගේ ප්‍රැන්සිස් ලෙස්ලි පෙරේරා මහතා.

(3) වත්තල, පල්ලිය පාර, අංක 45/8 හි පදිංචි අත්තොට දොන් සේනානායකගේ සෝමපාල මහතා.

(4) වත්තල, මාබෝල, මීගමු පාර, අංක 638 හි පදිංචි පිංචාදේවගේ විල්සන් ප්‍රනාන්දු මහතා.

(5) වත්තල, මාබෝල, දන්කනත්ත පාර, අංක 42 හි පදිංචි විජේසූරිය ආරච්චිගේ විල්ප්‍රඩ් ලැම්බට් පෙරේරා මහතා

(6) වත්තල, කුඩාඑදන්ඩ පාර, අංක 29/1 හි පදිංචි උස්හෙට්ටිගේ ජෝර්ජ් පෝල් ඔගස්ටස් පෙරේරා මහතා.

(7) වත්තල, ඇවරිවත්ත පාර, අංක 106/32 හි පදිංචි නානායක්කාර ඇන්තනී ක්‍රිස්ටෝපර් මහතා.

(8) වත්තල, තෙලඟපාත, පන්සල පාර, අංක 34 හි පදිංචි මහවලගේ දොන් ජයතිස්ස මහතා.

(9) වත්තල, ශ්‍රී වික්‍රම මාවත, අංක 80/35 හි පදිංචි වර්ණකුලසූරිය මහමතුගල කංකානමලාගේ බාරොන් ප්‍රනාන්දු මහතා.

(10) වත්තල, පල්ලිය පාර, අංක 40 හි පදිංචි නුගේගොඩගේ දොන් නිකුලස් ගුණසේකර මහතා.

(11) වත්තල, තෙලඟපාත පාර, අංක 71 හි පදිංචි සුගතපාල චන්ද්‍රසේකර මහතා.

(12) වත්තල, මීගමු පාර, අංක 239/3 හි පදිංචි ජයලත් පතිරැන්නහලාගේ ජෝශප් ඇනස්ලි පෙරේරා මහතා.

(13) වත්තල, මාබෝල, මීගමු පාර, අංක 704 හි පදිංචි මොහම්මදු ලෙබ්බේ අහමදු අබ්දුල්ලා මහතා.

(14) වත්තල, මීගමු පාර, අංක 507 හි පදිංචි බෝදරගමගේ සිරිසේන ගුණසේකර මහතා.

(15) වත්තල, තෙලඟපාත, කල්‍යාණී මාවත අංක 57/25 හි පදිංචි පැලියගොඩගේ දොන් ජූලියන් මහතා.

(16) වත්තල, මීගමු පාර, අංක 173 හි පදිංචි මහහේවාගේ බැස්ටියන් පෙරේරා මීගහපොල මහතා.

(17) වත්තල, මීගමු පාර, අංක 247/6 හි පදිංචි වතුතන්ත්‍රිගේ මාෂල් අල්විස් මහතා.

(18) වත්තල, මීගමු පාර, අංක 461/1 හි පදිංචි ඉන්ද්‍රවංශ පෙරේරා අමරසිංහ මහතා.

(19) වත්තල, ඇවරිවත්ත පාර, අංක 123 හි පදිංචි විදානරාලලාගේ ස්ටීවන් සුවාරිස් මහතා.

(20) වත්තල, මීගමු පාර, අංක 236 හි පදිංචි මාකවිටගේ ජෝන් ක්‍රිසොස්ටම් පරාක්‍රම පෙරේරා මහතා.

(21) වත්තල, මීගමු පාර, අංක 500 හි පදිංචි ගුරුනාන්සෙලාගේ පැට්රික් නිකුලස් ද සිල්වා මහතා.

(22) වත්තල, දුම්රියපොල පාර, අංක 20 හි පදිංචි ක්ලැරන්ස් මාක් ජයවර්ධන මහතා.

(23) වත්තල, මාබෝල, අංක 697 හි පදිංචි ජයසේකරගේ ඔස්ටින් ආතර් පෙරේරා මහතා.

(24) වත්තල, ගල්වැටිය පදිංචි බී. පී. එච්. කුරේ මහතා.

(ආ) වත්තල, මීගමු පාර, අංක 416 හි පදිංචි ඉලුක්සූරිය ආරච්චිගේ රේමන් පෙරේරා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත්කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-1009/8

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) හා 4 (3) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ

කන්දපල්ල කෝරළේ ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිඥයක සභාවේ සියළුම සාමාජිකයින් හා සභාපති ද එකී තනතුරුවලින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-1009/9

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) හා 4 (3) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ නගර සභා ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිඥයක සභාවේ සියළුම සාමාජිකයින් හා සභාපති ද එකී තනතුරුවලින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

11-1009/10

---

අංකය : සීඅයිආර්/862/70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් කෑගල්ලේ මෙඩිකල් සෙන්ටර්හි, දෙස්තර ඩී. ආර්. එල්. ප්‍රනාන්දු මහතා බාරේ ජී. සී. ප්‍රනාන්දු මහතා,

හා

අනික් පාර්ශ්වය වශයෙන්, දෙලොස්බාගේ, ගලමුදුන වතුයායේ අයිතිකරුවන් වන, පානදුර, "සල්ගාදු විලා" හි, පානදුර පී ඇන්ඩ් රබර් කොම්පැණි ලිමිටඩ් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XV වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 16 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරාවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන් කෑගල්ලේ මෙඩිකල් සෙන්ටර් හි දෙස්තර ඩී. ආර්. එල්. ප්‍රනාන්දු මහතා බාරේ,
ජී. සී. ප්‍රනාන්දු මහතා

සහ

අනික් පාර්ශ්වය වශයෙන්, දොලොස්බාගේ ගලමුදුන වතුයායේ අයිතිකරුවන් වන, පානදුර, 'සල්ගාදු විලා'හි පානදුර පී ඇන්ඩ් රබර් කොම්පැණි ලිමිටඩ්, අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුව පවත්නා කාරණය වනුයේ ;

ජී. සී. ප්‍රනාන්දු මහතා, දොලොස්බාගේ, ගලමුදුන වතුයායේ ක්ෂේත්‍ර සහායක (ෆීල්ඩ් ඇසිස්ටන්ට්) තනතුරින් පහකිරීම යුක්ති සහගතද, යන්න හා ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න වේ.

1970 නොවැම්බර් මස 8 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

11-974

---

අංක : සීඅයිආර්/336/70.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1970 ඔක්තෝබර් මස 23 දින අංක 14,929 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1970 ඔක්තෝබර් මස 8 වන දින දරන නියෝගයෙන් මහනුවර, හල්ඔළුව පාරේ 70හි, කේ. රත්නවේල් මහතා සහ කොළඹ 11, සී ස්ට්‍රීට්, 263හි මර්කන්ටයිල් කෝපරේෂන් ලිමිටඩ් බැරේ රම්බොඩ, රංග්බොඩ වත්තේ අයිතිකරුවන් වන ද රංග්බෙඩ එස්ටේට් ලිමිටඩ් අතර ඇති 1970 සැප්තැම්බර් මස 17 දින දරන ආරාවුල පිළිබඳව වැඩ බලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා මීගමුව ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙරකදෝරු කීර්ති ද සොයිසා මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1970 ඔක්තෝබර් මස 8 දින දරණ නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 16 දින,
කොළඹ දීය.

11-975/1

---

අංකය : සීඅයිආර්/336/70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශවයක් වශයෙන්, මහනුවර හල්ඔළුව පාරේ, 70 හි කේ. රත්නවේල් මහතා හා අනික් පාර්ශ්වය වශයෙන්, රම්බොඩ රංග්බොඩ වත්තේ අයිතිකරුවන් වන, (1) ද මර්කන්ටයිල් කෝපරේෂන් ලිමිටඩ්, 263, සී ස්ට්‍රීට්, කොළඹ 11, (2) රංග්බොඩ එස්ටේට්ස් ලිමිටඩ්, 263, සී ස්ට්‍රීට්, කොළඹ 11,

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39, 1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කුලියාපිටිය ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙරකදෝරු සේනක ජයතිලක මහතාට මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 16 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන්

මහනුවර, හල්ඔළුව පාරේ 70 හි කේ. රත්නවේල් මහතා

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

රම්බොඩ රංගබොඩ වත්තේ අයිතිකරුවන් වන,

(1) ද මර්කන්ටයිල් කෝපරේෂන් ලිමිටඩ්, 263, සී ස්ට්‍රීට්, කොළඹ 11;

(2) රංගබොඩ එස්ටේට්ස් ලිමිටඩ්, 263, සී ස්ට්‍රීට්, කොළඹ 11

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ :

රම්බොඩ, රංගබොඩ වත්තේ පාලක පක්ෂය විසින් කේ. රත්නවේල් මහතා වතු අධිකාරි තනතුරෙන් පහකිරීම යුක්ති සහගතද, යන්න හා ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න වේ.

1970 නොවැම්බර් මස 9 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

11-975/2

---

අංකය : සී/අයි 19.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත

**4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1970.8.28 දින අංක 14,921 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1970.8.19 වන දින දරන නියෝගයෙන් එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය, 123, යුනියන් පෙදෙස, කොළඹ 2 සහ වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන් ලිමිටඩ්), තැ. පෙ. 166, කොළඹ, අතර ඇති 1970.8.12 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කේ. පී. වී. කරුණාරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දුන් පෙනියන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1970.8.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 17 දින,
කොළඹ දී ය.

11-1017/1

---

අංකය : සී/අයි. 19

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

**4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය, 123, යුනියන් පෙදෙස, කොළඹ 2

හා

වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) ලිමිටඩ්, තැ. පෙ. 166, කොළඹ අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගම්පහ ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු ආනන්ද ජයසිංහ මහතාට මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 17 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය,
123, යුනියන් පෙදෙස, කොළඹ 2

සහ

වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන් ලිමිටඩ්,
තැ. පෙ. 166, කොළඹ

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණ නම්,

වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) ලිමිටඩ්හි සේවයේ යොදවා සිටින එක්සත් ඉංජිනේරු කම්කරු සමිතියේ සාමාජිකයන් වෙනුවෙන් එම සමිතිය කර ඇති පහත දක්වෙන ඉල්ලීම් යුක්ති සහගතද, එම සාමාජිකයන්ට කුමන සහනයන් හිමිද යන්නත් වේ:—

(i) 2 වන හා 3 වන වාර වැඩකිරීම වෙනුවෙන් සේවකයෙකුට දිනකට රු. 2 ගණනේ වාර වැඩ සඳහා දීමනාවක් ගෙවීම ;

(ii) එක් එක් සේවකයාට නිල ඇඳුම් නොදෙන්නේ නම් ඒ වෙනුවට නිල ඇඳුම් දීමනා ගෙවීම ;

(iii) එක් එක් සේවකයාට වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් මාස දෙකක ඒකාබද්ධ වැටුප ගෙවීම.

1970 නොවැම්බර් මස 9 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

11-1017/2

---

# විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

## සමුපකාර සමිති පිළිබඳ ආඥාපනත (124 වෙනි අධිකාරය)

**සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම**

පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක සමිතියේ නම ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමන ලද බව, සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52 (2) වෙනි වගන්තිය අනුව, මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| | සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|---|
| 1. | සීමාසහිත පැලද මෝල්කාව ගොවිද්‍රව්‍ය නිපදවීමේ සහ අලෙවිකිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.10. 2 |
| 2. | සීමාසහිත නත්තරම්පොත සමුපකාර කඩ සමිතිය ... | 70.10. 2 |
| 3. | සීමාසහිත තල්මුපාවු ශාන්ත මේරි කාන්තා දල් වියන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | 70.10. 2 |
| 4. | සීමාරහිත බෝධිමලුව සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... ... | 70.10. 8 |
| 5. | සීමාරහිත රත්නකදෙනිය සකසුරුවම් කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... | 70.10.12 |
| 6. | සීමාසහිත මතුගම පාර්ලිමේන්තු කොට්ඨාශයේ තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | 70.10.16 |
| 7. | සීමාසහිත පිටවෙල සමුපකාර කඩ සමිතිය ... | 70.10.30 |
| 8. | සීමාසහිත පාතහේවාහැට තොටමුන්න සමුපකාර කඩ සමිතිය ... ... ... | 70.10.30 |
| 9. | සීමාසහිත ගල්පාය සමුපකාර කඩ සමිතිය ... | 70.10.30 |

ටී. ඩී. ඇල්. පීරිස්,
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ
සමුපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්,

1970 නොවැම්බර් මස 17 වෙනි දින,
කොළඹ,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

11—1104

## ප්‍රකාශනයයි

යාපනය දිස්ත්‍රික්කයේ වැලිකාමම් උතුර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් මයිලිඞ්ඩි ප්‍රදේශයේ පිස්සුබලු උවදුර පවතින බැව් මට ඒත්තු ගොස් තිබෙන නිසා, මයිලිඞ්ඩි ප්‍රදේශයේ සීමාවලට අයත් සියලුම ප්‍රදේශ පිස්සුබලු උවදුර පවතින හෝ පැතිරීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස මෙම ගැසට් නිවේදනය පළවූදා සිට මාස 6 ක කාලයක් යන තුරු පිස්සුබලු ආඥාපනතේ (476 වන පරිච්ඡේදයේ) 11 වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2. ප්‍රකාශයට පත් කරන ලද යථෝක්ත ප්‍රදේශය තුළ, පුද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර ප්‍රසිද්ධ ස්ථානයකදී, පාරකදී හෝ වෙන යම් ස්ථානයකදී හමුවන, පටියකින් හෝ කෙනෙකු විසින් ගෙන යනු නොලබන ඕනෑම බල්ලකු දුටු වහාම මරා දැමීමට ඉඩ තිබේ.

එම්. ඊ. ඩබ්ලිව්. අමරසේකර,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 නොවැම්බර් මස 14 දින,
දිසාපති කාර්යාලය, යාපනය.

11-916

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුයි.

උපලේඛනය

1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි